# वनितायां वार्ता

15 පාඩම

## चित्रं पश्य

एका वनिता जलं ग्रहीतुं अगमत्। सा घटं जलेन पूरयितुं वायमति। ग्रीष्मे अस्मिन् प्रदेशे जलं लब्धुं न सुकरं। अन्या जलं आदाय गृहं गन्तुं प्रस्थिता। सा जलं नेतुं द्वे भाजने एव आनयत्। चित्रे दक्षिण पार्श्वे सजले अन्यप्रदेशे द्वे वनिते जलाय गत्वा सल्लपितुं कालं नयथः। ते जलं ग्रहीतुं एव परं सम्भाषितुं अपि आगच्छताम् इति दृश्यते ।तत् अनन्तरं पात्रं पूरयित्वा जलं उत्तरितुं आरभ्य बहिः स्रवति। पश्य एकायाः जलं नास्ति। अन्ये जलं निष्कारणेन निक्षिपितुं यततः। रक्षितुं न एव उत्सझतः। अयं अपराधं इति एव मन्तु कुतः ते न उद्यमतः। किं इदं वारयितुं न वायमतः।

### ක්‍රියාකාරකම 1

1. ඉහත දක්වා ඇති ඡේදයේ සඳහන් සියලු පූර්වක්‍රියා පද සහ තුමන්ත ක්‍රියාපද උපුටා ගෙන වෙන වෙන ම ලැයිස්තුවක් සකසන්න.

2. ගුරුතුමාගේ උදවු ඇතිව මෙම ඡේදය සිංහලයට නගන්න.

3. සියලුදෙනා එක් ව ඡේද කොටස ශබ්ද නගා කියවන්න.

## ක්‍රියාකාරකම 2


1. පහත දැක්වෙන පද නිවැරදි අනුපිළිවෙලට පෙළගස්වා වාක්‍ය නිර්මාණය කර අභ්‍යාස පොතේ ලියන්න.

१. गृह्णाति / आगत्वा / जलं / बिलात् / ग्रहीतुं / वनिता / जलाय ।
२. जलं / द्वे / सा / एव / भाजने / अनयत् / नेतुं ।
३. पुष्पानि / विहारोद्यानं / गन्तुं / श्रामणेरः / चेतुं / चिन्तयति ।
४. कालं / जलाय / द्वे / सल्लपितुं / गत्वा / नयतः / हसितुं च / वनिते ।
५. दातुं / आवश्यकानि / धनवान् / चिन्तित्वा / चेतुं / समारभत् / द्रव्यानि / महादानं ।
६. गन्तुं / आगच्छति / पातुं / वनात् / नदीं / जलं / गजयूथः ।
७. देशयितुं / नाम / धर्मं / बुद्धः / वाराणसी / अगच्छत् / नगरं ।
८. बुद्धं / प्रतिग्रहीतुं वा / न गच्छामः / भिक्षवः / इति / कर्तुं / वा / अतिथ्यं / पञ्चवर्गीयाः / अमन्त्रयन् / दृष्टवा ।

2. ගුරුතුමාගේ උදවු ඇතිව ඔබ පිළිවෙලින් සැකසූ වාක්‍ය සිංහලයට පෙරළා අභ්‍යාස පොතේ ලියා වැරදි නිවැරදි කරගන්න.

## ක්‍රියාකාරකම 3

1. ඔබේ අභ්‍යාස පොතේ මෙම රූපය ඇඳගන්න. කුඩා රවුමේ ඇති වර්තමානකාල ක්‍රියාපදවලින් පූර්ව ක්‍රියාපද සාදා සපයා ඇති නිදසුන අනුව ලොකු රවුම් දෙකෙහි ලියන්න. ගුරුතුමාගේ සහාය ලබාගන්න.




2. ඔබ ලියූ පූර්ව ක්‍රියාපද හා තුමන්ත ක්‍රියාපද අතුරෙන් කැමති පද 5ක් තෝරාගෙන ඒවා යොදා සරල සිංහල වාක්‍ය 5ක් නිර්මාණය කරන්න. පසුව ගුරුතුමාගේ උදවු ඇතිව එම වාක්‍ය සංස්කෘතයට නගා දේවනාගරී අකුරින් ලියා වැරදි නිවැරදි කරගන්න.

## අභ්‍යාස සඳහා උපකාරක පද

### නාමපද

स्थल - පොළොව
मत्स्य - මාලු
श्लोकार्थ - ශ්ලෝකයේ තේරුම
उद्यान - උයන
कासार - විල
आश्रम - විහාරය/ අසපුව
प्रचारभूमि - තණබිම
शयन - ඇඳ
कालिङ्गदेश - කාලිංග නම් දේශය
घट - කළය
छक्षिणपार्श्व - දකුණු පැත්ත
निष्कारण - නිකරුණේ
उत्साह - උනන්දුව
अपराध - අපරාධය
उद्यम - උත්සාහය
भवत् - පින්වත් තැනැත්තා
काल - මරණය
दुःखित - දුකට පත්
प्रवृज्या - පැවිද්ද
अतिकारुणिक - ඉතා කරුණාවන්ත
अतिरेकाहारा - වෙනත් ආහාර
सम्मार्जन - අතුගෑම
अध्ययनकार्य - ඉගෙනීම් කටයුතු
कृताभ्यास - කළ අභ්‍යාස
लेखनउपकरण - ලියන උපකරණ
स्वहस्त - තම අත
प्रत्यागमनवेला - ආපසු එන වෙලාව
स्नेह - සෙනෙහස/ ආදරය
जनक - පියා
सहस्र - දහස
विरल - ටිකක්/ ස්වල්ප
देशनशाला - දේශන ශාලාව
बिल - බිලය, කුඩා සිදුර
विहारोद्यान - විහාර උයන/ වත්ත
आवश्यक - ඉතා අවශ්‍ය
द्रव्य - දේ, බඩු
महादान - ලොකු දානය
धनवत् - ධනවතා
गजयूथ - ඇත් රංචුව
वाराणसी - බරණැස
अतिथ्य - ආගන්තුක සත්කාර
पञ्चवर्गीय - පස් වර්ගයට අයත්
जन्मदिन - උපන් දිනය
नय - ආකාරය/ ක්‍රමය
दीर्घायुष - දිගු ආයුෂ
बलकाय - කුඩා/ ළදරු කාලය
अतिशय - ඉතා
प्रचार्य - ගුරුතුමාගේ ගුරුවරයා
उपाध्याय - ගුරුවරයා (පැවිදි කළ)
रोगी - රෝගී වූ
औषध - බෙහෙත්
शौद्धायन - පිරිසිදු කිරීම
लिखित - ලියූ, ලියූ දේ
बाहिर - වෙනත්
अमन्द - අඩුවක් නැති
सायाह्न - සවස් කාලය
द्वार - දොරටුව
विस्मय - පුදුමය
विद्यापीठ - උසස් විද්‍යාලය
प्रत्यय - හේතුව, ආධාරය
ग्रीष्म - උණුසුම, ග්‍රීෂ්ම කාලය

## ක්‍රියා පද

| | | | |
|---|---|---|---|
| पश्य | බලන්න | सल्लपति | කථාවෙහි යෙදෙයි |
| निक्षिपति | ඉවත දමයි | सम्भाषति | එක්ව කථා කරයි |
| वायमति | වදයම් කරයි | दृश्यते | දක්නා ලැබේ |
| लब्धुं | ලබන්නට | नुत्तरति | උතුරා යයි |
| सुकर | පහසුවෙන් කළහැකි | आरभति | අරඹයි |
| प्रस्थित | පිටත් වූ | स्रवति | ගලායයි |
| नास्ति | නැත | यतति | වෙරදරයි |
| उत्सहति | උනන්දු වෙයි | उद्यमति | උනන්දු වෙයි |
| वायमति | වදයම් කරයි | गृह्णाति | ගනී |
| प्रतिगृह्णाति | පිළිගනී | मन्त्रयति | කොඳුරා කතිකා කරයි |
| शयति | නිදයි | जानाति | දැනගනී |
| आलोचयति | ආශිර්වාද කරයි | भुञ्जापयति | කවයි |
| वदति | කියයි | पृच्छति | අසයි, ප්‍රශ්න කරයි |
| आशिंसाति | බලයි | उपसिशति | උපදෙස් දෙයි |
| प्रतीक्षति | නැවත බලයි | धोवति | සෝදයි |
| चोदयति | පොළඹවයි | स्थापयति | තැන්පත් කරයි |
| शोषयति | වේලයි | परिश्रमति | වෙහෙසවෙයි |
| विमर्शयति | සොයා බලයි | शक्नोति | හැකිවෙයි |
| प्राप्नोति | පැමිණෙයි/ පත්වෙයි | आह्वयति | කැඳවයි |

## නිපාද පද

| | | | |
|---|---|---|---|
| साधुकं | හොඳින් | आपि | ද |
| इति | යැයි, කියා | कुतः | කෙසේ |
| किं | කිමෙක් ද?/ කුමක් ද? | वा | හෝ |
| अद्य | අද | तहि | එවිට |
| सततं | නිතර | प्रतिदिनं | දිනපතා |
| स्वयं | තමා | यदां | යම් දිනක |
| त्दा | එකල | बहिः | පිටත |
| नूनं | ඒකාන්තයෙන් ම | | |